# ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

# இலங்கை தேசிய பட்டினி ஒழிப்பு இயக்கச் சபை

# Sri Lanka National Freedom From Hunger Campaign Board




## වාර්ෂික වාර්තාව

## வருடாந்த அறிக்கை

## Annual Report

# 2015

# පටුන



| **මාතෘකාව** | **පිටු අංකය** |
|---|---|
| දැක්ම සහ මෙහෙවර | 2 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 3 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 5 |
| මණ්ඩලයේ තොරතුරු | 6 |
| සමස්ථ කාර්ය සාධනය 2015 | 7 |
| වාර්ෂික ගිණුම් වාර්තාව | 11 |
| විගණකාධිපති වාර්තාව | 28 |

# 2015 - වාර්ෂික වාර්තාව

## දැක්ම

ගොවි ජනතාවගේ සහ අඩු වරප්‍රසාද ඇති ජනතාවගේ අභිමානය නැවතත් ඇති කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් ආර්ථික ස්වාධීනත්වය සහ ස්ව විශ්වාසය ඇති කිරීම

## මෙහෙවර

ප්‍රතිලාභීන්ගේ ආර්ථික ස්වාධීනත්වය ඇති කිරීමටත් අනුන් මත යැපීමේ සංස්කෘතිය මග හැරවීම සඳහාත් කෘෂිකර්ම, පශු සම්පත් සහ වෙනත් ක්ෂේත්‍ර වල නිපුණතා සංවර්ධනය සඳහා සහභාගීත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

# 2015 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය

| නම | තනතුර | සේවා ස්ථානය |
|---|---|---|
| ධම්මික පීරිස් මහතා | සභාපති | ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය |
| රවී ක්‍රිෂාන් ජයවර්ධන මහතා | උප සභාපති | ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය |
| ඩී.එම්.එල්. බණ්ඩාරනායක මහතා | අතිරේක ලේකම් (සංවර්ධන) | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| ඩබ්.එම්. දීප්ති ප්‍රනාන්දු මහත්මිය | අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) | ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යාංශය |
| පි.එස්.එස් විජේරත්න මහතා | ජ්‍යොෂ්ඨ සහකාර ලේකම් | වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යාංශය |
| එච්.ජී.ජී.ජේ ධර්මසේන මහතා | අධ්‍යක්ෂ ජනරාල් | මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව |
| එම්.එෆ්.කේ. නිසා මහත්මිය | සහකාර අධ්‍යක්ෂ | ජාතික අයවැය දෙපාර්තමේන්තුව |
| විජයසිරි වික්‍රමසිංහ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක 409/3සී, මහයියාවවත්ත, කලපුවාව, මුල්ලේරියාව නගරය |
| පී.ඩබ්.ධර්මසිරි වැලිකල මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක 95, බණ්ඩාරනායක මාවත, මිහිඳුපුර, අනුරාධපුර |
| ඒ.ටී.එම්. ඒකනායක මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක 121, යසසිරිපුර, අනුරාධපුර |
| ක්‍රිෂාන් නිලංග මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 898/ ඒ4, දියතෙර,පහලවෙල පාර, පැල්වත්ත |

# 2015 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වූ දිනයන්

363 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2015.03.19

364 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2015.06.30

365 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2015.10.09

366 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2015.12.30

2015 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල පැවැත්වූ දින ගණන = 04

**සභාපතිතුමාගේ සමාලෝචනය.**

ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ සභාපති ලෙස 2015 වසරේ වාර්ෂික වාර්තාව වෙනුවෙන් සමාලෝචනාත්මක කාර්ය සාධනයක් ඉදිරිපත් කරනු ලබනුයේ හද පිරි සතුටිනි.
අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ වස විසෙන් තොර දේශීය කෘෂි ආර්ථිකයක් මගින් කෘෂිකර්මාන්තයේ තිරසාර සංවර්ධනයක් යන සංකල්පය පෙරදැරි කොටගෙන වස විසෙන් තොර සෞඛ්‍යමත් දේශීය ආහාර ප්‍රවර්ධනය උදෙසා කටයුතු කරමින් සිටිනු ලබන අතර, මේ සඳහා ගරු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක මැතිතුමාගේ මග පෙන්වීම හා ආශිර්වාදය අතිමහත් වැදගත්ය.

2015 වසර සඳහා අප මණ්ඩලය මගින් පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති සිදු කරන ලදී.

1. මව්පෝෂ සහ සුවපෝෂ පෝෂණීය ආහාර නිෂ්පාදනය සහ ප්‍රවර්ධන ව්‍යාපෘතිය.
2. බුත්තල සහ තණමල්විල ගොවිපල සංවර්ධන ව්‍යාපෘතිය.
3. ගොවි නිෂ්පාදන අලෙවි සැල් ව්‍යාපෘතිය.
4. වස විස නැති අපේ ආහාර - හෙල්දි ෆුඩ් ව්‍යාපෘතිය
5. දේශීය පාරම්පරික සහල් නිෂ්පාදන හා පරිභෝජනය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය.
6. සෝයා මිශ්‍ර විශේෂිත සහල් පිටි නිෂ්පාදන නියමු ව්‍යාපෘතිය.
7. කුරක්කන් සීරියල් ෆ්ලේක්ස් නියමු ව්‍යාපෘතිය.

මෙම ප්‍රධාන ව්‍යාපෘති වලට අමතරව නූතන අවශ්‍යතා වලට ගැලපෙන පරිදි නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා වෙත උපරිම සාධාරණයක් ලබාදීම උදෙසා දෙහිවල සහ නාරාහේන්පිට ගොවි නිෂ්පාදන අලෙවි සැල් පිහිටුවා ඇති අතර එමගින් නාගරික ප්‍රජාව සඳහා සෙත සැලසීම ද සිදුවේ. එසේම දෙහිවල සහ නාරාහේන්පිට නාගරික ප්‍රදේශවල පිහිටා ඇති පැල තවාන් මගින් නාගරික ජනතාව සඳහා අඩු ඉඩකින් උපරිම ඵලදාවක් ලැබෙන පරිදි කෘෂි බෝග වගා කිරීමේ ක්‍රම හා එළවළු, මල් වර්ග, ඖෂධ පැළ සහ පළතුරු පැළ වර්ග සහන මිලට ලබා දීමත්, වගාවන් සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීමත් සිදු කරයි.

අපගේ කලංකුට්ටිය සහ ගන්නෝරුව පිහිටි නිෂ්පාදනාගාර මගින්, වස විස නැති දේශීය සහල්, තෝසේ පිටි, විශේෂිත සහල් පිටි, මව්පෝෂ, සුවපෝෂ, සිසුපෝෂ වැනි නිෂ්පාදන වෙළඳපලට ඉදිරිපත් කිරීමට හැකියාව ලැබී ඇත.
වස විසෙන් තොර සෞඛ්‍යමත් දේශීය සහල් සහ පාරම්පරික සහල් ජනතාව අතර ප්‍රචලිත කිරීමත්, එමගින් ගොවීන් වෙත උපරිම ආදායමක් ලබා දීමත් සිදු කරනු ලැබේ. එසේම අපගේ ධාන්‍යමය නිෂ්පාදන වන මව්පෝෂ, සුවපෝෂ, විශේෂිත සහල් පිටි මිශ්‍රණය, විශේෂිත තෝසේ පිටි මිශ්‍රණය වෙළඳ පොල වෙත නිකුත් කිරීම තුලින් අප ජනතාවගේ පෝෂණ තත්වය ඉහල නැංවීම සඳහා දායකත්වයක් ලබා දී ඇත.

එසේම විවිධ පර්යේෂණ ආයතන මගින් නව පෝෂ්‍යදායක ආහාර වර්ග එළි දක්වනු ලබන නමුත් ඒවා ප්‍රවර්ධනය සඳහා කිසිදු රජයේ ආයතනයක් ඉදිරිපත්වීම විරල සිදුවීමක් වේ. ඒ අනුව එම කාර්යය සිදු කිරීමේ මූලික පියවරක් ලෙස කුරක්කන් මිශ්‍රිත සීරියල් ෆ්ලේක්ස් සහ සෝයා මිශ්‍රිත විශේෂිත සහල් මිශ්‍රණය එළි දක්වන ලදී. මේ පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආහාර පර්යේෂණ ඒකකය මගින් පරීක්ෂණ පවත්වා තිබුණි. මෙවැනි ව්‍යාපෘති නොකඩවා සිදුකර ජනතාවට අවශ්‍ය පෝෂ්‍යදායි වස විසෙන් තොර ආහාර ලබා දීමට බලාපොරොත්තු වේ.

එසේම මෙම කාර්යයන් පුළුල් කර ඉදිරියේදී වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමත්, නව නිෂ්පාදන හඳුන්වා දීමත්, ඒවා ජනතාව අතර සුලභ කිරීමත්, එමගින් නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට සෙත සැලසීමත් යනාදී කරුණු මුල් කොටගෙන කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

ධම්මික පීරිස්
සභාපති
ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය.

**(ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය)**

## මණ්ඩලයේ තොරතුරු

**මණ්ඩලයේ නම:**
ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය (පෙර ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය)

**පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය:**
1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනත මගින් ස්ථාපිත කර ඇත. 2009 වසරේ ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය ලෙස නම වෙනස් කිරීමට කැබිනට් අනුමැතිය ලැබුනි. ප්‍රධාන කාර්යාලය කොළඹ 5, කිරිමණ්ඩල මාවතේ අංක 45 හි පිහිටා ඇත.

**මූලික ක්‍රියාකාරකම් සහ අරමුණු:**
ප්‍රධාන ලෙස ආර්ථික අසාධාරණත්වයට භාජනය වූ ජනතාවට සේවය සපයන ආයතනයකි. අරමුණු වන්නේ;

- රජය විසින් සකස් කරන ලද සංවර්ධන වැඩ පිළිවෙලට අනුකූලව සාමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා විදේශීය, දේශීය නියෝජ්‍යාත්ව වල ආධාර ලබා ගැනීම.
- මහජනෝපකාර සාමාජීය හා ආර්ථික සංවර්ධනය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආයතනවලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම.
- කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය කෙරෙහි යොමු වූ නිශ්චිත යෝජනා ක්‍රමවලට ආධාර කිරීම, එම යෝජනා ක්‍රම දියුණු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
- කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ යෝජනා ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ නොවූ නියෝජ්‍යාත්ව උනන්දු කිරීම.
- ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාරය සහ වෙනත් ඒ හා සමාන පිටරට ආයතන, සංගම් හෝ සමිති සමග සහයෝගී වීම.

**රේඛීය අමාත්‍යාංශය- කෘෂිකර්ම අමාත්‍යාංශය**

**කාර්යාලය:**
අංක 45, කිරිමණ්ඩල මාවත, කොළඹ 5
දූරකථනය: 0112506895
ෆැක්ස්: 0112506907
විද්‍යුත් ලිපිනය: ffhc.srilanka@gmail.com

**විගණකවරු:**
විගණකාධිපති දෙපාර්තමේන්තුව

**බැංකුකරුවන්:**
ලංකා බැංකුව - බොරැල්ල
මහජන බැංකුව - දෙහිවල

**උපාය මාර්ග:**

- සංවර්ධන මූලයන් සාමූහික අරමුණක් කෙරෙහි යොමු කිරීමට සමෝධානය කිරීම.
- ගැමි ජනතාවට ආර්ථික සහ සමාජ වර්ධනයට සහයෝගී වීම සඳහා අවස්ථාව ලබා දීම.
- සංවර්ධන ක්‍රියාවලියට සහභාගීවීම සඳහා ගැමි ජනතාවට බලය ලබා දීම.
- ස්වයං ප්‍රචලිත තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා පාරම්පරික ගැමි ජනතාවගේ ස්ව විශ්වාසය ඇති කිරීම සමග ලබා ගත හැකි අගයයන් වෙත වෙනස් කිරීම.
- දේශීය ආහාර භාවිතය සහ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම
- පසු අස්වනු හානිය අවම කිරීමේ තාක්ෂණය බිම් මට්ටම තෙක් රැගෙන යාම.

# සමස්ථ කාර්ය සාධනය - 2015

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය 2015 වසරේදී ව්‍යාපෘති 09 ක් සිදු කර ඇති අතර මෙම ව්‍යාපෘති වල සංක්ෂිප්ත විස්තර පහත දැක්වේ.

## 1. පැළ අලෙවි සැල - නාරාහේන්පිට

නාගරික වැසියන්ගේ ගෙවතු වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය පහසු මිලට මිලදී ගැනීමට අවස්ථාව සැලසීම සඳහා මෙම පැල තවාන නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ ආරම්භ කරන ලදි. සියලු වර්ග වල මල් පැල, දුර්ලභ වර්ගයේ පලතුරු පැල, එළවළු පැල හා බීජ වර්ග මෙම තවානෙන් මිලදී ගත හැක.
මීට අමතරව එළවළු හා මල් පොහොර, කාබනික පොහොර, කෘමි විකර්ෂක, කෘෂි උපකරණ ආදිය මෙම ස්ථානයෙන් මිලට ගත හැක. එසේම මෙම ස්ථානයෙන් බෝග වගා පිළිබඳ උපදෙස් ද නොමිලේ ලබා ගත හැක. මෙම වසරේ මෙම ව්‍යාපෘතිය සඳහා මෙහෙයුම් වියදම රු. මි 7.085 වන අතර මෙහෙයුම් ආදායම ලෙස රු. මි. 7.828 ලබාගෙන ඇත. එසේම වසරේ ශුද්ධ ලාභය රු. මි. 1.346කි. මෙම දත්ත අනුව පසුගිය වසරට වඩා මෙම ව්‍යාපෘතිය දියුණුවක් ලබා ගෙන ඇත.

## 2. ගොවි නිෂ්පාදන අලෙවි  සැල - දෙහිවල

ජනතාව අතර වස විස නැති ආහාර ප්‍රචලිත කිරීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම වෙළඳ සැල තුලින් දේශීය නිෂ්පාදකයින්ගේ සකස් කල ආහාර නිෂ්පාදන, පාරම්පරික සහල් වර්ග හා අප ආයතනය විසින් නිෂ්පාදනය කරන මව්පෝෂ, සුවපෝෂ, තෝසේ පිටි සහ විශේෂ සහල් පිටි මිලට ගැනීමට හැක. මීට අමතරව දේශීය ආකාරයට සැකසූ උදෑසන හා දිවා ආහාර පහසු මිලට ගැනීමට අවස්ථාව උදාකර ගත හැක. දෙහිවල සත්වෝද්‍යානය තුලද මෙවැනි අලෙවි සැලක් පිහිටුවා ඇත. මෙම අලෙවි සැල් මඟින් ප්‍රදේශයේ ජනතාවට මහඟු සේවයක් ඉටු වේ. මෙම වසරේ මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආදායම රු. මි. 44.427 කි. වියදම රු. මි 43.079 කි. ඒ අනුව වසරේ ශුද්ධ ලාභය රු. මි. 1.449 කි.

## 3. බුත්තල ගොවිපල සංවර්ධනය

මෙම ව්‍යාපෘතිය 1986 වසරේ ආරම්භ කල අතර ආදර්ශ වගාවක් ලෙස අධ්‍යයනය කිරීමේ අරමුණින් යුතුව ආරම්භ කරන ලදි. 2014 ජුනි වන තෙක් ආයතනය විසින් මුදල් ආයෝජනය කර ගොවිපල වගාවන් සිදු කල අතර 2015 අගෝස්තු මාසයේදී බුත්තල ගොවිපල සංවර්ධනය සඳහා රු.මි 1.9443 ක මුදලක් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලැබුනි.  එම මුදලින් රු. මි 1.0173 ක් වැයකර ගොවිපල වල් අලින්ගෙන් ආරක්ෂාව සඳහා විදුලි වැටක් ඉදි කරන ලදි.

ඉතිරි මුදලින් අක්කර 3 1/2 ක බඩ ඉරිඟු වගාව ආරම්භ කරන ලදි. එහි අස්වැන්න වශයෙන් 2015 ජනවාරි මාසයේදී බඩ ඉරිඟු 4550 kg ලබා ගන්නා අතර, එය අලෙවි කිරීමෙන් රු. 150,018.00 ක ආදායමක් උපයා ගන්නා ලදි. එසේම රු.මි 0.4739ක් වැය කර වගා ළිං 2ක් ප්‍රතිසංස්කරණය කරන ලදි. තවද වම්බටු, බෝංචි, තක්කාලි, බණ්ඩක්කා වැනි එළවලු වගාවන් සුළු පරිමාණයෙන් වගා කර අස්වැන්න විකිණීමෙන් රු.මි 0.095 ක් උපයා ගන්නා ලදි.

මෙයට අමතරව බුත්තල ගොවිපලේ සිදු කරනු ලැබූ කාබනික පොහොර නිෂ්පාදන අලෙවියෙන් රු.මි.0.27ක ආදායමක් උපයාගත් අතර මෙම ව්‍යාපෘතිය ආරම්භයේදි ලාභ ඉපයීමේ අරමුණින් නොව ජනතාවට මහගු සේවයක් ඉටු කිරීම සඳහා දියත් කරන ලදි. මෙම වසරේ මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආදායම රු. මි.0.463  ක් වන අතර වියදම රු. මි 1.44 කි.

## 4. තණමල්විල ගොවිපල සංවර්ධනය

තණමල්විල ගොවිපලද ආදර්ශ වගාවන් ලෙස දීර්ඝ කාලයක් තිස්සේ පවත්වාගෙන යන ගොවිපලකි.
2014 වර්ෂයේ අගෝස්තු මාසය වන තෙක් ආයතනය විසින් මුදල් වැයකර පාරම්පරික වී වර්ග මෙම ගොවිපලේ වගා කරන ලදි. 2015 වර්ෂයේ රු.මි 1.39 ක් ලැබුනු අතර, එම මුදලින් රු. මි. 0.34 ක් වැයකර වගා ළිං 1ක් ප්‍රතිසංස්කරණය කරන ලදි. එසේම රු.මි 0.141 ක් වියදම් කර සුවඳැල් වී වගා කිරිමෙන් අස්වැන්න ලෙස වී 3100 කි.ග්‍රෑ ලබාගත් අතර ආදායම ලෙස රු .මි 0.217 උපයාගන්නා ලදි. මුරුංගා, බඩඉරිගු, වට්ටක්කා වැනි භෝග වගාවන් සුලු පරිමාණයෙන් වගා කරන ලදි.

.



## 5. පැළ තවාන - දෙහිවල

නාගරික වැසියන්ට ගෙවතු සංවර්ධනය සඳහා අවශ්‍ය සියළුම දේ පහසු මිලට ලබා දීම සඳහා මෙම අලෙවි සැල ආරම්භ කරන ලදි. මෙම පැල තවානේ සියළු වර්ග වල මල් පැල, දුර්ලභ වර්ගයේ පලතුරු පැල, එළවළු පැල හා බීජ වර්ග මෙම තවානෙන් මිලදී ගත හැක. මීට අමතරව එළවළු හා මල් පොහොර, කාබනික පොහොර, කෘමි විකර්ෂක, කෘෂි උපකරණ ආදිය මෙම ස්ථානයෙන් මිලට ගත හැක. මෙම වසරේ ආදායම ලෙස රු.මි 3.417 උපයා ඇති අතර රු.මි 3.33 ක් වියදම් කර ඇත.

## 6. සෝයා ආශ්‍රිත නිෂ්පාදන සැකසීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය දියවැඩියාව ඇතුළු බෝ නොවන රෝග පාලනයට හා පාන් පිටි පරිභෝජනය පහල දැමීම හා සෝයා ආශ්‍රිත නිෂ්පාදන ජනතාව අතර ප්‍රචලිත කර ජනතාවගේ පෝෂණ මට්ටම ඉහල දැමීම අරමුණු කරගෙන ආරම්භ කරනු ලැබූ පර්යේෂණාත්මක ව්‍යාපෘතියකි. මෙම පර්යේෂණ කටයුතු සිදු කරන ලද්දේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකයේ වන අතර, ඒ සඳහා රු.මි 4ක් වැය කරන ලදි. මේ වන විට පෞද්ගලික හවුල්කාරීත්වය සමඟ මෙම නිෂ්පාදන වෙළඳපලට හඳුන්වා දීම සඳහා මූලික පියවර ගෙන ඇත.

## 7.හෙල්දි ෆුඩ් භෝජනාගාරය - නාරාහේන්පිට

මෙම ව්‍යාපෘතිය 2014.04.01 වර්ෂයේදී නාගරික පාරිභෝගිකයන් වෙත පහසු මිලට දේශීය ආහාර සැපයීම අරමුණු කොට ගෙන ආරම්භ කරන ලදි. මෙහිදි දේශිය වට්ටෝරු වලට අනුව ආහාර පිළියෙළ කරයි. මීට අමතරව ආයතනය විසින් නිෂ්පාදනය කරන ලද සහ සුළු හා මධ්‍යම ව්‍යවසායකයන් නිපදවන ලද දේශිය නිෂ්පාදන ද අලෙවි කරයි. 2015 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආදායම රු.මි 14.936 ක් වූ අතර මෙහෙයුම් වියදම රු.මි 19.154 ක් වේ.
එසේම මෙම ව්‍යාපෘතියට අදාළ 2014 වර්ෂයේ ශුද්ධ අලාභය රු.මි 4.218 ක් වේ. එම අලාභය 2016 වර්ෂයේදී අඩු කිරීමට කටයුතු කර ඇත.

## 9 .සුවපෝෂ පෝෂණීය ආහාරය, සහල් පිටි, තෝසේ පිටි, මව්පෝෂ ව්‍යාපෘතිය

වතුකරයේ සහල් පිටි භාවිතය ප්‍රචලිත කිරීමේ අරමුණින් සහල් පිටි සහ තෝසේ පිටි ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර මෙම ව්‍යාපෘතිය කලංකුට්ටිය කර්මාන්ත ශාලාව තුල ක්‍රියාත්මක වේ. සහල් පිටි, තෝසේ පිටි ව්‍යාපෘතිය අඩු බර ගර්භනී කාන්තාවන්ට පෝෂණ මල්ලක් සැපයීම යන ව්‍යාපෘති මහින්ද චින්තන සංකල්පයට අනුව ආරම්භ කරන ලදි.

මෙම නිෂ්පාදන කටයුතු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආහාර පර්යේෂණ ඒකකයේ හා කලංකුට්ටිය කර්මාන්ත ශාලාවේදී සකසනු ලැබේ. 2014 අවසාන වන තෙක් මෙම නිෂ්පාදන සඳහා දිවි නැගුම දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ලද අතර තෝරාගත් දිස්ත්‍රික්ක වල සමෘද්ධි බැංකු හරහා බෙදා හැරීම සිදු කරන ලදි. 2015 වසරේ පෝෂණමල්ල සඳහා දිවිනැගුම දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපාදන නොලැබුණු බැවින් මෙම නිෂ්පාදන අප ආයතනයේ ප්‍රදර්ශණාගාර හා හෙල්දි ෆුඩ් ෂොප් සඳහා පමණක් නිෂ්පාදනය කෙරුණි.












# 10. භාණ්ඩාගාර ප්‍රතිපාදන

| | අයවැය ප්‍රතිපාදන 2014 (රු.මි.) | ලැබුන ප්‍රධානයන් (රු.මි.) | සත්‍ය වියදම (රු.මි.) | වැඩි වියදම (රු.මි) |
|---|---|---|---|---|
| පුනරාවර්තන | 46.1766 | 37.274 | 42.772 | 3.403 |
| ප්‍රාග්ධන | 5.00 | 5.0 | 5.04 | (0.039) |
| එකතුව | 51.1766 | 42.274 | 47.81 | 3.364 |

# 2015 වාර්ෂික ගිණුම් වාර්තාව

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය**

මෙම මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සාමාන්‍ය පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සකස් කර ඇති අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, ඓතිහාසික පිරිවැය පදනම මත සහ අඛණ්ඩ පැවැත්ම පදනම මත පිහිටා සකස් කර ඇත.

**ගිණුම්කරණ ප්‍රතිපත්ති:**

1. වත්කම් වල නව මිලදී ගැනීම්, මිලදී ගත් වටිනාකමටද (පිරිවැයට) අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණන වටිනාකමටද (සාධාරණ අගයට) පෙන්වා ඇත.
   ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්, වත්කම් වල ඵලදායි ජීවිත කාලය පුරා ක්ෂය කරනු ලබන අතර, ප්‍රත්‍යාගණන දිනට පෙර පැවති වටිනාකම පහත සඳහන් ක්ෂය ප්‍රතිශතයන් අනුව ක්ෂය කර ඇත.
   පහත සඳහන් ක්ෂය ප්‍රතිශතයන්ට ක්ෂය ගණනය කර ඇත්තේ වත්කම් මිලදී ගත් දින සිට ප්‍රත්‍යාගණනය කරන ලද දින දක්වා වේ.

   **ක්ෂය කිරීමේ අනුපාත**

   | | |
   |---|---|
   | ඉඩම් සහ ගොඩනැගිලි | 5% |
   | මෝටර් වාහන | 20% |
   | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 10% |
   | යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍ර සූත්‍ර | 20% |
   | ඡායාරූප සහ සිනමා උපකරණ | 10% |
   | කෘෂිකාර්මික උපකරණ | 20% |
   | උද්‍යාන උපකරණ | 10% |
   | වෙනත් උපකරණ | 20% |
   | කාර්යාලීය උපකරණ | 10% |
   | සුළු උපකරණ සහ මිනුම් උපකරණ | 20% |
   | තාවකාලික ගොඩනැගිලි | 5% |
   | පරිගණක හා මෘදුකාංග | 20% |

2. ලැබිය යුතු ශේෂ, බොල් සහ අඩමාන ණය සඳහා වෙන්කල පසු ශුද්ධ වශයෙන් ලැබිය යුතු මුදලට ගිණුම් ගතකර ඇත.

3. හඳුනාගත් සියළුම වගකීම් සඳහා වෙන් කිරීම් කර ඇත.

4. පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් ගණනය කර ඇත්තේ පාරිතෝෂිත හිමි එක් එක් සේවකයන්ගේ වර්ෂ පදනම් කර ගනිමිනි.

5. වියදම් ඉක්මවා ගිය ආදායම් ගණනය කර ඇත්තේ දන්නා සියළුම වගකීම් සඳහා වෙන් කිරීම් සිදු කල පසුවය.

6. තොග ගණනය කරනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගයට වන අතර, පහත සඳහන් තොග සඳහා පිරිවැය පහත සඳහන් ක්‍රම යටතේ ගණනය කරනු ලබයි.
    a. අමුද්‍රව්‍ය - ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයට සත්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
    b. නොනිමි තොග - සෘජු අමුද්‍රව්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
    c. නිමි තොග - සෘජු අමුද්‍රව්‍ය, විචල්‍ය පොදුකාර්යය පිරිවැය සහ සෘජු වැටුප් සත්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
    d. පාරිභෝගික ද්‍රව්‍ය - සත පෙන්වනු ලබයි.

7. රජයෙන් ලද ප්‍රතිපාදන ආදායම් ප්‍රකාශනයේ ආදායමක් ලෙස වෙනමත් වියදම් අයිතමයන් වෙනමත් ඉදිරිපත් කර ඇත.

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය**

1. 2015 වර්ෂය තුලදී ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

| ව්‍යාපෘතිය | අරමුදල් ලබා දුන්නේ | ව්‍යාපෘතිය පිහිටි ස්ථානය |
|---|---|---|
| ගොවිපල සංවර්ධනය - තණමල්විල | ස්ව අරමුදල් සහ කෘෂිකර්ම අමාත්‍යාංශය | තණමල්විල |
| ගොවිපල සංවර්ධනය - බුත්තල | ස්ව අරමුදල් සහ කෘෂිකර්ම අමාත්‍යාංශය | බුත්තල |
| එක්ස්කෘඩ් ෆ්ලේක් සංවර්ධනය | කෘෂිකර්ම අමාත්‍යාංශය | ගන්නෝරුව |
| සෝයා ආශ්‍රිත සහල් පිටි නිෂ්පාදනය | කෘෂිකර්ම අමාත්‍යාංශය | ගන්නෝරුව |
| දේශිය සහල් ව්‍යාපෘතිය | කෘෂිකර්ම අමාත්‍යාංශය | කලංකුට්ටිය |
| පැල තවාන - ප්‍රධාන කාර්යාලය | ස්ව අරමුදල් | නාරාහේන්පිට |
| ගොවිපල සංවර්ධනය - අම්බලන්තොට | ස්ව අරමුදල් | අම්බලන්තොට |
| වතුකරයේ සහල් පිටි පාරිභෝජනය ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන | ස්ව අරමුදල් | කළංකුට්ටිය |
| සුවපෝෂ පෝෂණ පැකට්ටුව | ස්ව අරමුදල් | ගන්නෝරුව |
| මව්පෝෂ පෝෂණ පැකට්ටුව | ස්ව අරමුදල් | ගන්නෝරුව |
| කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම | ස්ව අරමුදල් | බුත්තල |
| ගොවි නිෂ්පාදන අලෙවි සැල-දෙහිවල | ස්ව අරමුදල් | දෙහිවල |
| හෙල්දිව් ලුඩි භෝජනාගාරය | ස්ව අරමුදල් | නාරාහේන්පිට |

2. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය යටතේ පහත සඳහන් ජංගම ගිණුම් මෙම වසරේදී පවත්වාගෙන යන ලදී.

194125 - භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන
කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලැබෙන ප්‍රතිපාදන, ගොවිපල සංවර්ධනය - බුත්තල, ගොවිපල සංවර්ධනය - තණමල්විල, අම්බලන්තොට ගොවිපල, සුවපෝෂ ව්‍යාපෘතිය, මව්පෝෂ ව්‍යාපෘතිය, වතුකරයේ සහල් පිටි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, පැල තවාන, දෙහිවල අලෙවි සැල, හෙල්දිව් ලුඩි භෝජනාගාරය, කොම්පෝස්ට් ව්‍යාපෘතිය

138295 - දෙහිවල අලෙවිසැලේ ආදායම

3. සෑම ව්‍යාපෘතියක් සඳහාම වෙන වෙනම ලෙජර් පවත්වාගෙනු යනු ලබයි.

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය**
**2015 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| විස්තරය | සටහන | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|
| ***වත්කම්*** | | | |
| ***ජංගම නොවන වත්කම්*** | | | |
| **දේපල පිරියත සහ උපකරණ** | 1 | ***342,006,088.38*** | ***343,497,339.56*** |
| ඉඩම් | | 307,200,000.00 | 307,200,000.00 |
| ගොඩනැගිලි | | 16,373,609.27 | 13,039,577.17 |
| මෝටර් වාහන | | 5,875,000.00 | 8,707,000.00 |
| යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍ර සූත්‍ර | | 2,177,383.41 | 3,371,800.00 |
| ලී බඩු සහ සවිකිරීම් | | 1,346,928.26 | 1,328,520.00 |
| කාර්යාල උපකරණ | | 1,962,203.81 | 2,016,165.50 |
| කෘෂිකාර්මික උපකරණ | | 443,000.00 | 639,500.00 |
| උද්‍යාන උපකරණ | | 200,000.00 | - |
| වෙනත් උපකරණ | | 2,146,815,.37 | 2,439,350.00 |
| ඡායාරූප සහ සිනමා උපකරණ | | - | 3,540.00 |
| පරිගණක උපාංග | | 1,084,277.38 | 1,292,160.00 |
| තාවකාලික ගොඩනැගිලි | | 2,127,987.55 | 2,239,986.89 |
| මිනුම් උපකරණ | | 100,183.33 | 130,740.00 |
| | | | |
| **අස්පෘශ්‍ය වත්කම්** | | | |
| මෘදුකාංග | | 968,700.00 | 1,089,000.00 |
| | | | |
| **මූල්‍ය වත්කම්** | | ***855,088.71*** | ***826,984.98*** |
| ඉතුරුම් තැන්පතු | | 774,478.21 | 746,374.48 |
| ණය | | 80,610.50 | 80,610.50 |
| | | | |
| ***ජංගම වත්කම්*** | | ***8,064,308.68*** | ***11,495,780.47*** |
| තැන්පතු | | 201,816.50 | 201,816.50 |
| තොගය | | 4,874,033.32 | 9,609,552.48 |
| ණයගැතියෝ | | 979,476.77 | 999,476.77 |
| අත්තිකාරම් | | 21,900.00 | 33,400.00 |
| ලැබිය යුතු මුදල් | | 317,900.51 | 581,768.31 |
| අතැති සහ බැංකු මුදල් | | 1,669,181.58 | 69,766.41 |
| | | | |
| **මුළු වත්කම්** | | **350,925,485.77** | **355,820,105.01** |
| | | | |
| ***හිමිකම් හා වගකීම්*** | | | |
| ***ප්‍රාග්ධනය සහ සංචිත*** | | ***334,367,991.14*** | ***343,255,663.66*** |
| අරමුදල් ශේෂය | | 375,001,390.22 | 370,001,390.22 |
| ඒකාබද්ධ අරමුදල | | (40,633,399.08) | (26,745,726.56) |
| | | | |
| ***ජංගම නොවන වගකීම්*** | | ***10,245,455.80*** | ***5,426,693.20*** |
| විශ්‍රාම පාරිතෝෂිත වගකීම් | | 4,845,455.80 | 2,926,693.20 |
| මධ්‍ය කාලීන ණය | | 5,400,000.00 | 2,500,000.00 |
| | | | |
| ***ජංගම වගකීම්*** | | ***6,312,038.83*** | ***7,137,748.15*** |
| කෙටි කාලීන ණය | | 187,500.06 | 375,000.03 |
| රඳවාගත් මුදල් | | 668,747.75 | 256,669.35 |
| උපචිත වියදම් | | 5,455,791.02 | 6,506,078.77 |
| ***මුළු හිමිකම් හා වගකීම්*** | | **350,925,485.77** | **355,820,105.01** |

## ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
## 2015 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විස්තරය | සටහන් | රු. 2015 | රු. 2014 |
|---|---|---|---|
| **ආදායම්** | | **41,753,482.54** | **50,048,316.74** |
| භාණ්ඩාගාර/අමාත්‍යාංශ ප්‍රදාන | | 38,720,477.23 | 25,516,568.00 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 2 | 2,507,011.58 | 23,968,173.48 |
| ඉතිරි කිරීම් ගිණුම්වල පොලිය | | 28,103.73 | 122,366.70 |
| වත්කම් ඉවත් කිරීමෙන් ලද මුදල | | 1,773,392.00 | 68,383.56 |
| වත්කම් විකුණුම් මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම | | (1,771,892.00) | - |
| වෙනත් ආදායම් | | 496,390.00 | 372,825.00 |
| | | | |
| ***වියදම්*** | | **55,678,542.06** | **48,126,802.63** |
| පුද්ගල වේතන | | 34,085,445.29 | 20,237,177.46 |
| ගමන් වියදම් | | 148,900.95 | 79,955.00 |
| සැපයුම් සහ අවශ්‍යතා | | 1,257,729.96 | 1,669,799.53 |
| ස්ථාවර වත්කම් අළුත්වැඩියාව සහ නඩත්තුව | | 4,312,188.80 | 6,463,475.08 |
| පරිවර්තන, සන්නිවේදන, උපයුක්ත සහ වෙනත් සේවාවන් | | 15,874,277.06 | 19,676,395.56 |
| | | | |
| ***වියදම ඉක්මවූ ආදායම / අතිරික්තය (ඌනතාවය)*** | | **(13,925,059.52)** | **1,921,514.11** |

# ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාවන් (භාවිතා කරන) / ලැබෙන මුදල් ප්‍රවාහය** | | | |
| ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය/අලාභය | | (13,925,059.52) | 1,921,514.11 |
| ගැලපුම් | | | |
| ක්ෂය කිරීම් | 1 | 5,360,214.21 | 4,322,664.08 |
| ආයෝජන ක්‍රියාකාරකම් මගින් ඉපැයූ ආදායම | | (28,103.73) | (122,366.70) |
| විශ්‍රාමික පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | | 1,918,762.60 | 750,109.60 |
| ප්‍රත්‍යාගණන ලාභය/අලාභය | | - | 328,671,316.14 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය** | | **(6,674,186.44)** | **335,543,237.23** |
| තොගය (වැඩිවීම්) / අඩුවීම් | | 4,735,519.16 | (5,134,402.52) |
| වෙළඳ සහ වෙනත් ලැබීම් (වැඩිවීම්) / අඩුවීම් | | 295,367.80 | 576,316.65 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ වල වැඩි කිරීම් | | (638,209.35) | (946,477.66) |
| මෙහෙයුම් මගින් ජනනය වු මුදල් | | 4,392,677.61 | (5,504,563.53) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ලද ශුද්ධ මුදල් | | **(2,281,508.83)** | **330,038,673.70** |
| **ආයෝජන ක්‍රියාකාරකම් මගින් ලැබුණු / (භාවිතා කල) මුදල් ප්‍රවාහ** | | | |
| දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනිම් | 1 | (5,527,463.03) | (7,325,206.63) |
| දේපල, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය | | - | (328,671,316.14) |
| දේපල, පිරියත සහ උපකරණ ඉවත් කිරීම්/මාරු කිරීම් | | 1,658,500.00 | 6,129,390.12 |
| ආයෝජන ක්‍රියාකාරම් මගින් ලැබෙන පොලී ආදායම් | | - | (415,890.20) |
| ආයෝජන ක්‍රියාකාරකම් / (භාවිතා කල) මගින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | | **(3,868,963.03)** | **(330,283,022.85)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මගින් ලද / (භාවිතා කල) මුදල් ප්‍රවාහ** | | | |
| අරමුදල් ලැබීම් | | 43,720,477.23 | 30,516,568.00 |
| ආධාර මුදල් | | (38,720,477.23) | (25,516,568.00) |
| පෙර කාලච්ඡේද ගැලපුම් | | 37,387.00 | (5,581,822.95) |
| ණය ලැබීම් | | 3,000,000.00 | - |
| ණය නැවත ගෙවීම් | | (287,499.97) | (104,166.65) |
| | | **7,749,887.03** | **(685,989.60)** |
| | | | |
| මුදල් සහ මුදල් වලට සමාන දේ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | 1,599,415.17 | (930,338.74) |
| වර්ෂය මුලදී තිබු මුදල් සහ මුදල් වලට සමාන දේ | | 69,766.41 | 1,000,105.15 |
| වර්ෂය අවසානයේදී තිබු මුදල් සහ මුදල් වලට සමාන දේ | | **1,669,181.58** | **69,766.41** |
| **සටහන - A** | | | |
| බැංකු ශේෂය | | 69,766.41 | 918,739.46 |
| සුළු මුදල් අග්‍රිමය | | - | 80,214.96 |
| අත ඉතිරි මුදල් | | - | 1,150.73 |
| | | **69,766.41** | **1,000,105.15** |

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය**
**2015 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | ප්‍රත්‍යාගණන අරමුදල රු. | අරමුදල් ශේෂය රු. | ඒකාබද්ධ අරමුදල රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| 01.01.2015 දිනට ශේෂය | 328,671,316.14 | 41,330,074.08 | (26,745,726.56) | 343,255,663.66 |
| | | | | |
| ලැබුණු අරමුදල් | | 43,720,477.23 | | 43,720,477.23 |
| | | | | |
| ආධාර මුදල් | | (38,720,477.23) | | (38,720,477.23) |
| | | | | |
| පෙර කාලච්ඡේද ගැලපීම් | | | 37,387.00 | 37,387.00 |
| | | | | |
| | | | | |
| | | | | |
| වසර සඳහා ශුද්ධ අතිරික්තය (ඌනතාව) | | | (13,925,059.52) | (13,925,059.52) |
| | **328,671,316.14** | **46,330,074.08** | **(40,633,399.08)** | **334,367,991.14** |

## සටහන 01
### ජංගම නොවන වත්කම්

| වත්කම් වර්ගය | ඉඩම් සහ ගොඩනැගිලි | මෝටර් වාහන | යන්ත්‍රෝපකරණ සහ උපකරණ | කාර්යාලිය උපකරණ | ලි බඩු සහ සවිකිරීම් | කෘෂි උපකරණ | උද්‍යාන උපකරණ | වෙනත් උපකරණ | ජායාරූප සහ සිනමා උපකරණ | තාවකාලික ගොඩනැගිලි | මැනිම් උපකරණ | පරිගණක උපාංග | මෘදුකාංග වෙනත් | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 20151.01 ට ශේෂය | 320,239,577.17 | 8,707,000.00 | 3,371,800.00 | 2,016,165.50 | 1,328,520.00 | 639,500.00 | - | 2,439,350.00 | 3,540.00 | 2,239,986.89 | 130,740.00 | 1,292,160.00 | 1,089,000.00 | 343,497,339.56 |
| එකතු කිරීම් | 4,000,000.00 | - | 166,980.00 | 340,056.28 | 350,826.75 | - | 200,000.00 | 174,000.00 | - | - | - | 295,600.00 | - | 5,527,463.03 |
| ඉවත් කිරීම් / මාරු කිරීම්(ස්ථාවර වත්කම්) | - | (1,007,000.00) | (650,000.00) | - | - | - | - | - | - | - | - | (1,500.00) | - | (1,658,500.00) |
| ඉවත් කිරීම් / මාරු කිරීම්(මෙතෙක් ක්ෂය කර ඇති අගයන්) | - | 1,007,000.00 | 650,000.00 | - | - | - | - | - | - | - | - | 1,500.00 | - | 1,658,500.00 |
| වර්ෂය සඳහා ක්ෂය වීම් | (665,967.90) | (2,832,000.00) | (1,361,396.59) | (394,017.97) | (332,418.49) | (196,500.00) | - | (466,534.63) | (3,540.00) | (111,999.34) | (30,556.67) | (503,482.62) | (120,300.00) | (7,018,714.21) |
| ප්‍රත්‍යාගණනය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 2015.12.31 දිනට ශුද්ධ අගය | **323,573,609.27** | **5,875,000.00** | **2,177,383.41** | **1,962,203.81** | **1,346,928.26** | **443,000.00** | **200,000.00** | **2,146,815.37** | **-** | **2,127,987.55** | **100,183.33** | **1,084,277.38** | **968,700.00** | **342,006,088.38** |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ එකතුව | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ප්‍රත්‍යාගණන ඌණතාවයේ එකතුව | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| දල ධාරණ වටිනාකම | **324,519,357.99** | **7,700,000.00** | **2,888,780.00** | **2,356,221.78** | **1,679,346.75** | **639,500.00** | **200,000.00** | **2,613,350.00** | **3,540.00** | **2,239,986.89** | **130,740.00** | **1,586,260.00** | **1,089,000.00** | **347,646,083.41** |
| සමුච්චිත ක්ෂයවීම් | **(945,748.72)** | **(1,825,000.00)** | **(711,396.59)** | **(394,017.97)** | **(332,418.49)** | **(196,500.00)** | **-** | **(466,534.63)** | **(3,540.00)** | **(111,999.34)** | **(30,556.67)** | **(501,982.62)** | **(120,300.00)** | **(5,639,995.03)** |
| ශුද්ධ ධාරණ වටිනාකම | **323,573,609.27** | **5,875,000.00** | **2,177,383.41** | **1,962,203.81** | **1,346,928.26** | **443,000.00** | **200,000.00** | **2,146,815.37** | **-** | **2,127,987.55** | **100,183.33** | **1,084,277.38** | **968,700.00** | **342,006,088.38** |

**සටහන 02 :වෙළඳ හා ලාභ අලාභ ගිණුම්**

2.1 **දෙහිවල අලෙවි සැල**

**2015.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම**

| අයිතම | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| වෙළඳ ආදායම | **44,427,486.94** | **47,285,238.21** |
| අඩුකලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 1,481,735.70 | 1,620,879.72 |
| මිලදී ගැනීම් | 36,489,702.80 | 38,830,172.31 |
| ප්‍රවාහන | 62,060.00 | 60,780.00 |
| අවසාන තොගය | (1,574,895.14) | (1,832,983.42) |
| | 36,458,603.36 | 38,678,848.61 |
| **දළ ලාභය/අලාභය** | **7,968,883.58** | **8,606,389.60** |
| පොදු කාර්ය පිරිවැය | (6,519,382.34) | (6,121,579.19) |
| **ශුද්ධ ලාභය/අලාභය** | **1,449,501.24** | **2,484,810.41** |

2.2 **පැල තවාන ප්‍රධාන කාර්යාලය**

**2015.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම**

| අයිතම | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| වෙළඳ ආදායම | **7,828,601.61** | **6,378,381.02** |
| අඩුකලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 456,182.00 | 403,350.00 |
| මිලදී ගැනීම් | 5,073,167.50 | 4,411,191.00 |
| අවසාන තොගය | (1,059,868.78) | (456,182.00) |
| | 4,469,480.72 | 4,358,359.00 |
| **දළ ලාභය/අලාභය** | **3,359,120.89** | **2,020,022.02** |
| පොදු කාර්ය පිරිවැය | (2,012,214.42) | (1,708,337.83 ) |
| **ශුද්ධ ලාභය/අලාභය** | **1,346,906.47** | **311,684.19** |

## 2.3 පැල තවාන දෙහිවල

**2015.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම**

| අයිතම | 2015 රු. |
|---|---|
| වෙළඳ ආදායම | **3,417,684.50** |
| අඩුකලා: විකුණුම් පිරිවැය | |
| ආරම්භක තොගය | 351,247.72 |
| මිලදී ගැනීම් | 2,426,249.00 |
| අවසාන තොගය | (126,271.80) |
| | 2,651,224.92 |
| **දළ ලාභය/අලාභය** | **766,459.58** |
| පොදු කාර්ය පිරිවැය | (906,810.10) |
| **ශුද්ධ ලාභය/අලාභය** | **( 140,350.52)** |

## 2.4 වතුකරයේ සහල් පිටි භාවිතය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය - කලංකුට්ටිය

**2015.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා නිෂ්පාදන, වෙළඳ හා ලාභ අලාභ ගිණුම**

| අයිතමය | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| ආරම්භක තොගය | 3,352,991.90 | 750,058.10 |
| මිලදී ගැනීම් | 454,560.73 | 11,307,072.72 |
| තොග හානි | (3,546.00) | (59,612.60) |
| අවසන් තොගය - අමුද්‍රව්‍ය | (442,681.10) | (3,352,991.90) |
| අමුද්‍රව්‍ය සඳහා වියදම | 3,361,325.53 | 8,644,526.32 |
| සෘජු වැටුප් | - | 1,383,456.67 |
| ප්‍රවාහන වියදම් | - | 20,231.42 |
| නිෂ්පාදන වියදම් | 3,361,325.53 | 10,048,214.41 |
| විකුණුම් ආදායම | **665,226.03** | **14,300,287.00** |
| අඩු කලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 67,400.00 | 11,204.00 |

| | | |
|---|---|---|
| නිෂ්පාදන වියදම් | 3,361,325.53 | 10,048,214.41 |
| | 3,428,725.53 | 10,059,418.41 |
| අවසන් තොගය | (33,724.50) | (67,400.00) |
| | 3,395,001.03 | 9,992,018.41 |
| **දළ ලාභය/අලාභය** | **(2,729,775.00)** | **4,308,268.59** |
| **පොදු කාර්ය පිරිවැය** | (2,540,635.19) | (180,347.14) |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(5,270,410.19)** | **4,127,921.45** |

2.5 **සුවපෝෂ නිෂ්පාදන කර්මාන්ත ශාලාව - ගන්නෝරුව**

**2015.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ ලාභ අලාභ ගිණුම**

| අයිතමය | **2015**<br>රු. | **2014**<br>රු. |
|---|---|---|
| ආරම්භක තොග | 999,592.55 | 458,574.00 |
| මිලදී ගැනීම් | 132,516.72 | 6,513,780.35 |
| අවසන් තොග - අමු ද්‍රව්‍ය | (140,000.00) | (999,592.55) |
| අමුද්‍රව්‍ය සඳහා වියදම | 992,109.27 | 5,972,761.80 |
| සෘජු වැටුප් | - | 358,378.45 |
| ප්‍රවාහන වියදම් | - | 22,100.00 |
| ආරම්භක තොග - නොනිමි වැඩ | - | - |
| අවසන් තොග - නොනිමි වැඩ | - | - |
| නිෂ්පාදන පිරිවැය | 992,109.27 | 6,353,240.25 |
| විකුණුම් ආදායම | **255,544.00** | **8,493,152.50** |
| <u>අඩු කළා: විකුණුම් පිරිවැය</u> | | |
| ආරම්භක තොග | 155,950.00 | 10,000.00 |
| නිෂ්පාදන පිරිවැය | 992,109.27 | 6,353,240.25 |
| | 1,148,059.27 | 6,363,240.25 |
| අවසන් තොගය | (10,000.00) | (155,950.00) |
| | 1,138,059.27 | 6,207,290.25 |
| **දළ ලාභය/අලාභය** | **(882,515.27)** | **2,285,862.25** |
| පොදු කාර්ය පිරිවැය | (219,654.70) | (295,328.89) |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(1,102,169.97)** | **1,990,533.36** |

## 2.6 හෙල්දි ෆුඩ් භෝජනාගාරය

**2015.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම**

| අයිතම | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| විකුණුම් ආදායම | **14,936,207.64** | **16,395,350.08** |
| අඩුකලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 212,587.15 | - |
| මිලදී ගැනීම් | 12,068,008.05 | 14,308,582.42 |
| වැටුප් | 6,216,845.79 | 2,793,551.79 |
| අවසන් තොග | (237,898.50) | (212,587.15) |
| | 18,259,542.49 | 16,889,547.06 |
| **දළ ලාභය/අලාභය** | **(3,323,334.85)** | **(494,196.98)** |
| පොදු කාර්ය පිරිවැය | (869,198.24) | (1,008,816.88) |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(4,192,533.09)** | **(1,503,013.86)** |

## 2.7 මව්පෝෂ ව්‍යාපෘතිය

**2015.12.31න් අවසන් වූ වර්ෂය සඳහා නිෂ්පාදන වෙළඳ හා ලාභ අලාභ ගිණුම**

| අයිතම | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| ආරම්භක තොග | 1,681,715.46 | 576,998.00 |
| මිලදී ගැනීම් | 1,350,865.10 | 9,439,396.43 |
| සෘජු වැටුප් | - | 3,966,875.34 |
| ප්‍රවාහන | - | 752,393.00 |
| අවසන් තොග - අමු ද්‍රව්‍ය | (482,774.50) | (1,681,715.46) |
| | 2,549,806.06 | 13,053,947.31 |
| අවසන් තොග - නොනිමි වැඩ | | - |
| නිෂ්පාදන පිරිවැය | 2,549,806.06 | 13,053,947.31 |
| විකුණුම් ආදායම | **347,307.50** | **19,201,680.00** |
| <u>අඩු කලා: විකුණුම් පිරිවැය</u> | | |
| ආරම්භක තොග | 671,040.00 | 14,220.00 |
| නිෂ්පාදන පිරිවැය | 2,549,806.06 | 13,053,947.31 |
| | 3,220,846.06 | 13,068,167.31 |
| අවසන් තොගය | (295,460.00) | (671,040.00) |
| | 2,925,386.06 | 12,397,127.31 |

| | | |
|---|---|---|
| **දළ ලාභය/අලාභය** | **(2,578,078.56)** | **6,804,552.69** |
| පොදු කාර්ය පිරිවැය | **(3,862,981.49)** | (1,323,082.08) |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(6,441,060.05)** | **5,481,470.61** |

2.8 **බුත්තල කාබනික පොහොර ව්‍යාපෘතිය**

**2015.12.31න් අවසන් වූ වර්ෂය සඳහා නිෂ්පාදන වෙළඳ හා ලාභ අලාභ ගිණුම**

| **අයිතම** | **2015 රු.** | **2014 රු.** |
|---|---|---|
| ආරම්භක තොග | 136,460.00 | - |
| වගා කිරීමේ පිරිවැය | 43,879.00 | 217,924.69 |
| සෘජු වැටුප් | 109,568.40 | - |
| ප්‍රවාහන | - | - |
| අවසන් තොග - අමු ද්‍රව්‍ය | - | (136,460.00) |
| | 289,907.40 | 81,464.69 |
| ආරම්භක තොග - නොනිමි වැඩ | - | - |
| අවසන් තොග - නොනිමි වැඩ | - | - |
| නිෂ්පාදන පිරිවැය | 289,907.40 | 81,464.69 |
| විකුණුම් ආදායම | **272,885.00** | **476,090.00** |
| අඩු කලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොග | 42,650.00 | - |
| නිෂ්පාදන පිරිවැය | 289,907.40 | 81,464.69 |
| අවසන් තොගය | - | (42,650.00) |
| | **332,557.40** | **38,814.69** |
| **දළ ලාභය / අලාභය** | **(59,672.40)** | **437,275.31** |
| පොදු කාර්ය පිරිවැය | **(79,201.33)** | **(280,381.43)** |
| **ශුද්ධ ලාභය** | **(138,873.73)** | **156,893.88** |

## 2.9 පාරම්පරික සහල් ව්‍යාපෘතිය

**2015.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ ගිණුම හා ලාභ අලාභ ගිණුම**

| **අයිතම** | **2015 රු.** |
|---|---|
| ආරම්භක තොග | - |
| මිළදී ගැනීම් | 988,703.09 |
| ප්‍රවාහන | - |
| අවසාන තොගය | (313,509.00) |
| | 675,194.09 |
| විකුණුම් ආදායම | **105,710.00** |
| අඩු කලා: විකුණුම් පිරිවැය | |
| ආරම්භක තොග | **-** |
| නිෂ්පාදන පිරිවැය | 675,194.09 |
| | 675,194.09 |
| අවසන් තොගය | (156,950.00) |
| | 518,244.09 |
| **දළ ලාභය / අලාභය** | **(412,534.09)** |
| පොදු කාර්ය පිරිවැය | (1,075,732.36) |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(1,488,266.45)** |

## 2.10 බුත්තල ගොවිපල

**2015.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම**

| **අයිතම** | **2015 රු.** |
|---|---|
| ආරම්භක තොග | - |
| වගා කිරීමේ පිරිවැය | 46,338.80 |
| සෘජු වැටුප් | - |
| ප්‍රවාහන | - |
| අවසන් තොග - අමු ද්‍රව්‍ය | - |
| | 46,338.80 |
| ආරම්භක තොග - නොනිමි වැඩ | - |
| අවසන් තොග - නොනිමි වැඩ | - |
| නිෂ්පාදන පිරිවැය | 46,338.80 |

| | |
|---|---|
| විකුණුම් ආදායම | **190,656.50** |
| <u>අඩු කලා: විකුණුම් පිරිවැය</u> | |
| ආරම්භක තොග | - |
| නිෂ්පාදන පිරිවැය | 46,338.80 |
| අවසන් තොගය | - |
| | **46,338.80** |
| **දළ ලාභය / අලාභය** | **144,317.70** |
| පොදු කාර්ය පිරිවැය | (1,161,944.24) |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(1,017,626.54)** |

## 2.11 තණමල්විල ගොවිපල
## 2015.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම

| | |
|---|---|
| ආරම්භක තොග | - |
| වගා කිරීමේ පිරිවැය | 48,120.00 |
| සෘජු වැටුප් | - |
| ප්‍රවාහන | - |
| අවසන් තොග - අමු ද්‍රව්‍ය | - |
| | 48,120.00 |
| ආරම්භක තොග - නොනිමි වැඩ | - |
| අවසන් තොග - නොනිමි වැඩ | - |
| නිෂ්පාදන පිරිවැය | 48,120.00 |
| විකුණුම් ආදායම | **302,260.00** |
| <u>අඩු කලා: විකුණුම් පිරිවැය</u> | |
| ආරම්භක තොග | |
| නිෂ්පාදන පිරිවැය | 48,120.00 |
| අවසන් තොගය | - |
| | **48,120.00** |
| **දළ ලාභය / අලාභය** | **254,140.00** |
| පොදු කාර්ය පිරිවැය | (869,010.37) |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(614,870.37)** |

**වෙළඳ හා ලාභ අලාභ ගිණුම්**

| | |
|---|---|
| දෙහිවල අලෙවි සැල | 7,968,883.58 |
| නාරාහේන්පිට පැල තවාන | 3,359,120.89 |
| දෙහිවල පැල තවාන | 766,459.58 |
| කලංකුට්ටිය සහල් පිටි ව්‍යාපෘතිය | (2,729,775.00) |
| සුවපෝෂ ව්‍යාපෘතිය | (882,515.27) |
| හෙල්දි ෆුඩ් භෝජනාගාරය | (3,323,334.85) |
| මව්පෝෂ ව්‍යාපෘතිය | (2,578,078.56) |
| බුත්තල කොම්පෝස්ට් | (59,672.40) |
| පාරම්පරික සහල් ව්‍යාපෘතිය | (412,534.09) |
| බුත්තල ගොවිපල | 144,317.70 |
| තණමල්විල ගොවිපල | 254,140.00 |
| **එකතුව** | **2,507,011.58** |

03. සෘජු සංවර්ධන වියදම් ආධාර මුදල් යටතේ දක්වා ඇත.

04. ප්‍රධාන කාර්යාලයේ පරිපාලනය සඳහා දැරූ සියළුම වියදම් භාණ්ඩාගාර අරමුදල් යටතේ දක්වා ඇත.

05. භාණ්ඩාගාර අරමුදල්

| විස්තරය | අයවැය වෙන් කිරීම 2015 | 2015 සත්‍ය වියදම් | 2015 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන | ඉතිරිය/ ඌනතාවය |
|---|---|---|---|---|
| පුනරාවර්තන | 46,176,600.00 | 42,772,763.04 | 37,274,725.00 | 3,403,836.96 |
| ප්‍රාග්ධන | 5,000,000.00 | 5,039,251.75 | 5,000,000.00 | (39,251.75) |
| | | | **42,274,725.00** | |

06. කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ව්‍යාපෘති සඳහා ලැබුණු අරමුදල් පහත සඳහන් පරිදි පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ලෙස භාවිතා කරන ලදි.

| විස්තරය | ප්‍රාග්ධන | පුනරාවර්තන | එකතුව |
|---|---|---|---|
| ව්‍යාපෘති | - | 1,445,752.23 | 1,445,752.23 |
| | | | 1,445,752.23 |

07. අම්බලන්තොට ගොවිපලේ ඉදිකරන ලද වැට සඳහා ගෙවීමට නියමිත රු. 3,209,728.53 ක මුදල සඳහා කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක DMR 02401-13 යටතේ මේ වන විටත් විභාග වෙමින් පවති.

# 2015 විගණන වාර්තාව

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. ඒජීඑල්/ඩී/එච්සීබී/01/15/3 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016 සැප්තැම්බර් 09 දින

සභාපති,
ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනතේ 14 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2016 ජූනි 23 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

14 SEP 2016
1514
No. 45, Kirimandala Mw., Narahenpita.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂය තුල මුදල් ගලාඒම සහ මුදල් ගලායාම පිළිබිඹු වන පරිදි ක්‍රියාකාරකම් හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල විශ්‍රාම පාරිතෝෂික රු.392,864 ක් වැඩියෙන් වෙන්කර තිබුණි.

(ඇ) සේවක අර්ථසාධක අරමුදලේ හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකයන් ගණනය කිරීමේදී අන්තර් දීමනා හා විශේෂ දීමනා, ඉපැයීම් ලෙස සැලකීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එම අරමුදල් සඳහා පිළිවෙලින් රු. 514,373 ක් හා රු. 77,156 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොවිහාර අරමුදලින් 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අවස්ථා 3 කදී ලබා ගන්නා ලද රු. 2,875,000 ක් වූ ණය මුදල සමාලෝචිත වර්ෂය තුල ගෙවා අවසන් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් රු. 2,687,500 ක් ගෙවිය යුතුව පැවතුණි.

(ආ) 2011 හා 2012 වර්ෂවල සිට පැවත එන එකතුව රු. 883,015 ක් වූ වෙළඳ ණයගැති ශේෂ හා වසර 05 කට වඩා පැරණි රේඛීය අමාත්‍යාංශයෙන් අයවිය යුතු රු. 34,233 ක ශේෂය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලයට ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්වල දක්වා ඇති රු. 3,300,000 ක් නිරවුල් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණ අතර මෙම ශේෂය සනාථ කර ගෙනද නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.13,925,059 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,921,514 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 15,846,573 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. 13,203,909 කින් වැඩි වුවද වෙනත් මෙහෙයුම් ආදායම රු. 21,461,162 කින් අඩුවීම හා සේවක පාරිශ්‍රමික රු. 13,848,268 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් පැවතියද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.23,418,237 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.27,179,099 ක් දක්වා එනම් සියයට 16 කින් වර්ධනය වී තිබුණි.

3.2 මණ්ඩලයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව මණ්ඩලයට නීත්‍යානුකූල අයිතියක් නොමැති ඉඩමක 2012 වර්ෂයේදී වැටක් ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව බාහිර පාර්ශවයකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එහි වැඩ අවසන් කර තිබුණ ද කොන්ත්‍රාත්කරුට මුදල් නොගෙවීම නිසා රු. 3,209,728 ක වන්දි මුදලක් ලබා ගැනීම සඳහා ඔහු විසින් නීතිඥ ආයතනයක් මගින් මණ්ඩලයට එරෙහිව 2013 දෙසැම්බර් 31 දින එන්තර වාසියක් එවා තිබුණ අතර ඊට අදාල නඩු විභාගය 2016 මැයි 30 දින දක්වාම අවසන් වී නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

(අ) 1973 අංක 15 දරන සාගිනි නිවීමේ ව්‍යාපාර පනත ප්‍රකාරව,

(i) සමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා ආණ්ඩුවේ නොවූ විදේශීය හා දේශීය නියෝජ්‍යාත්වවල ආධාර ලබා ගැනීම.

(ii) සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආයතනවලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

(iii) කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනයට යොමු වූ යෝජනා ක්‍රමවලට ආධාර කිරීම, දියුණු කිරීම, සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ නොවූ නියෝජ්‍යත්ව උනන්දු කිරීම .

(iv) ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාර වෙනත් සමාන පිටරට ආයතන සමග සහයෝගී වීම මණ්ඩලයේ අරමුණු වේ.

(ආ) යථෝක්ත අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පිළිබඳව සිදුකරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ක්‍රියාකාරී සැලැස්මට අනුව දේශීය ආහාර පරිභෝජනය වර්ධනය කිරීම අරමුණු කරගෙන රු. 10,270,000 ක ප්‍රතිපාදන සලසා තිබූ දේශීය ස්වභාවික ආහාර ප්‍රවර්ධන දිස්ත්‍රික් වැඩසටහන හා ග්‍රාමීය වැඩසටහන සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 20,976,000 ක් වැය කර ඉටු කිරීමට සැලසුම් කරන ලද කාර්යයන් 06 ක් වෙනුවෙන් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් කිසිදු කාර්යයක් ඉටු කිරීමට අපොහොසත් වී තිබුණි.

(iii) ව්‍යාපෘති 11 කින් රු.මිලියන 220 ක ආදායමක් ලැබීමට සැලසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 11 කින් උපයා ඇති ආදායම රු. මිලියන 72 ක් පමණක් විය.

(iv) ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් නොවූ ව්‍යාපෘති 2 ක් සඳහා රු.මිලියන 1.4 ක් වැයකර තිබුණි.

## 4.2 පාඩු හා හානි

--------------

මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන මහවැලි අධිකාරියට අයත් වාහනය සමාලෝචිත වර්ෂය තුල අනතුරකට ලක් වීම හේතුවෙන් රු. 133,325 ක පාඩුවක් මණ්ඩලයට සිදුවී තිබුණි.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 28 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 74 ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 46 ක් විය.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තාවකාලික, අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 03 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2016 අප්‍රේල් 07 දින එනම් දින 37 ක ප්‍රමාද කාලයකින් පසුවය.

5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත ආදායම් සහ වියදම්, තථ්‍ය ආදායම් සහ වියදම් සමඟ සැසඳීමේදී සියයට 30 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5.3 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 වර්ෂයේදී ගොවීන් 19 ක් වෙත ගොවිබිම් සඳහා ජලය සැපයීමේ යන්ත්‍ර ලබාගැනීම සඳහා ලබා දෙන ලද රු. 80,610 ක ණය මුදල හා 2011 වර්ෂයේදී හිටපු උප සභාපතිවරයා විසින් ලබාගෙන තිබූ සුවපෝෂ හා මච්පෝෂ පැකට් වෙනුවෙන් අයවිය යුතු රු. 64,500ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ සංශෝධිත පනත ඉදිරිපත් කරන ලෙස 2012 ඔක්තෝබර් 01 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නියෝගයක් ලබා දී තිබූ අතර එම නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී නාරාහේන්පිට අලෙවිසැලේ සිදු වී තිබූ රු. 77,352 ක මුදල් සොරකම සම්බන්ධයෙන් චෝදනාපත්‍ර කෙටුම්පත හා මූලික විමර්ශන වාර්තා 2015 මැයි 05 දින ලබා දී තිබුණද විගණිත දිනය වූ 2016 ජූනි 08 දින වන විටත් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පරිපාලනය | අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණවත් විචලනයන් අනාවරණය වීම හා ණය නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) වත්කම් පරිපාලනය | වාහන විධිමත්ව පවරා නොගැනීම හා විධිමත්ව ලේඛනගත නොකිරීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලබා නොගැනීම, චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව බඳවා ගැනීම. |
| (ඈ) ව්‍යාපෘති කළමනාකරණය | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හා ව්‍යාපෘති අලාභ ලැබීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති